18983

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි.

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

iv. I ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු II පත්‍රයේ පිළිතුරු සමග අමුණා භාර දෙන්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1. සේවකයෝ <u>ගජරාමෙට</u> වැඩ කරන නිසා කර්මාන්ත ශාලාවේ ආදායම ඉහළ ගියේ ය.
(1) අවංකව (2) ඉතා කඩිසරව (3) උදාසීන බවෙන් (4) සාමූහිකව

2. පාසලේ සියලු දෙනා සමග සතුටින් සිටින බැවින් <u>පොතේගුරා</u> විය නොහැකි බව විදුහල්පතිතුමා පැහැදිලි කළේ ය.
(1) නීතියට ම වැඩ කරන්නා (2) සමාජවාදියා (3) සැර පරුෂ (4) නිදහස්

3. <u>වැලි කෙළියේ</u> පටන් එකට සිටි මිත්‍රයා හදිසියේ වෙන් වීම පිළිබඳව ඔහුට දැඩි කනස්සල්ලක් ඇති විය.
(1) වැලි මිශ්‍ර කිරීමෙන් (2) තරුණ අවධියේ (3) තනිවූ කාලයේ (4) බාල අවධියේ

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න

4. වැඩිවන ජනගහනයට සාපේක්ෂව ආහාර නිෂ්පාදනය වැඩි කිරීමට නොයෙකුත් .............................. ක්‍රම අත්හදා බැලීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සැරසෙයි.
(1) අභිවාදන (2) අභිජනන (3) අභිනන්දන (4) අභිචාර

5. උසස් රසිකයා, කලාකරුවා හා සමාන මානසික මට්ටමක් ඇතැ යි යන අදහසින් ...................... යනුවෙන් හැඳින්වෙයි.
(1) විචාරකයා (2) ප්‍රේක්ෂකයා (3) සහෘදයා (4) පාඨකයා

6. සෙල්ලිපි පරීක්ෂා කිරීමේ දී භෝඩියේ ............................... පිළිබඳව බොහෝ දේ උගත හැකි ය.
(1) පරිග්‍රහණය (2) පරිණාමය (3) පරිවර්තනය (4) පරිශීලනය

7. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
(1) සඳ කිඳුරු , බහින කලාව, කපුවා කපෝති, රත්තරන්
(2) පබාවතී, පේමතී ජායතී සෝකෝ, මහාසාර, වෙල්ල වැහුම්
(3) වෙද හටන, වෙස්සන්තර, වළහැඩියා, හැංගි හොරා
(4) කබුකි, මනමේ, සුභ සහ යස, රත්නාවලී

8. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න
(1) කාර්යාලය, පිළියෙල, ධාවනය, ළෙන්ගතු
(2) දුශ්සීල, ශිෂ්‍යාචාර, ධාර්මිෂ්ඨ, පරිගණකය
(3) අභිලාෂ, උෂ්ණ, සීඝ්‍රගාමී, විස්මය
(4) විමර්ශන, ආකර්ශන, නිර්නායක, සංශෝධන

9. පහත දී ඇති පද පේළිවල තුන්වන අක්ෂරයෙහි පිළිවෙළින් පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, ඇදය යෙදී ඇති වරණය වන්නේ,
(1) අනතුරු ව්, ඉක්බිති, උපකාරය, පරපුටු
(2) අකරුණාව, කිකිළිය, මල්වාන, කොස්සැට
(3) සුමුදු, මන්දිරය, හොරණෑව, ආරම්භය
(4) බූරුවා, පිරිසිදු, තාරාවා, කරුණු

10. <u>පොල් අතුවලින්</u> අලංකාර කළ <u>දරුවන්ගේ</u> මණ්ඩපය <u>මුහුදෙන්</u> හමන සුළං නිසා කඩා වැටේ දෝ බියෙන් අපි <u>බලධාරීන්ට</u> කරුණු කීවෙමු.
මෙහි ඉරිඇඳි පදවල විභක්ති අර්ථය වන්නේ,
(1) අවධි, කර්තෘ, සම්බන්ධ, ආධාර
(2) කරණ, සම්බන්ධ, ආධාර, ප්‍රථමා
(3) කරණ, සම්බන්ධ, අවධි, සම්ප්‍රදාන
(4) ප්‍රථමා, කර්තෘ, සම්බන්ධ, ආලපන

11. උක්ත පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න
(1) අයෙක්, හෙතෙම, දරුවෙක්, ඕ තොමෝ
(2) ගොවියන්, අපි, කම්කරුවෝ, හිමිවරු
(3) හාම්පුත්තු, සොරු, පණ්ඩිතයෝ, කෙනෙකු
(4) සේවකයෙක්, රජ තෙමේ, ගැහැනියක්, තිරිසනුන්

12. ප්‍රත්‍යයාර්ථ නාම යෙදී නැති වරණය තෝරන්න
(1) සොරා පොල් ගසේ කරටියට ම බඩ ගෑවේ ය.
(2) දිය කඩිති ප්‍රයෝජනයට ගත් මුල් ආර්යයෝ ජනාවාස ඉදිකිරීමට පටන් ගත්හ.
(3) වැවිලි ආර්ථිකය අපට උරුම වූයේ බටහිර ජාතීන් නිසා ය.
(4) ඖෂධ පැළැටි රැසක් වෙද මහතා මට තෑගි කළේ ය.

13. අර්ථයෙන් සමාන පද දෙකක් එකතු වී සැදෙන යුගල පදයක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.
(1) අඩුලුහුඬු, අණපනත්, එළිපෙහෙළි, ළමාළපටි
(2) තළාපෙළා, කෙළිකවට, නිවටනියාලු, සිප්සතර
(3) දුරදිග, කැඩිබිඳී, ඇඳකුද, සිතගත
(4) හුරුපුරුදු, වැඳුම්පිදුම්, නැණනුවණ, මළඉලවු

14. එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) උපදේශය – අවවාදය, අනුශාසනය, දැනමුතුකම, ඔවදන්
(2) පණ්ඩිත – විදග්ධ, මුග්ධ, පැණසර, නියවත්
(3) රීතිය – විලාසය, ශෛලිය, ආකාරය, පද්ධතිය
(4) අකුටිල – අවංක, අව්‍යාජ, ඍජු, නිබොරු

15. එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් නොදෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) ආරංචිය – පුවත, ප්‍රවෘත්තිය, පණිවිඩය, හසුන
(2) ආවරණය – වැස්ම, කොපුව, කවරය, වරණ
(3) කටකතා – ඕපාදූප, දූසමාන, ප්‍රලාප, වගතුග
(4) උමතුව – ඔල්මාදය, වියරුව, උන්මන්තක, සන්තාප

16. එක් එක් පද පේළිවල දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) විවර – ප්‍රමාණ, පාදප ශ්‍රේණි –ගස් පංති, වෙහෙල් – මුව
(2) වුවන – මුහුණ, සෙද –වහා, වර – ප්‍රමාණ, රඹ – පුවක්
(3) නිබඳ – නිරතුරු, සිදාදිය –නගරය, කුඹු– පාද, පුල–පිපුණු
(4) ආපත්ති–විපත්, සම්මුතිය–එකඟතාව, සුපුන්–දිවියන්, ප්‍රතිවීන–අපරදිග

17. බහු අර්ථ පදයක් වන මුලින් යෙදී ඇති පදයේ අර්ථ ඇතුළත් නොවන පදයක් ද ඇති පද පේළිය තෝරන්න.
(1) මාලු – පරණ, මහලු, මසුන්, ව්‍යාංජනය
(2) තුර – අතර, ගස, මධ්‍යය, දෙව්ලොව
(3) දල – පත්‍රය, ජලය, අංශය, චණ්ඩ
(4) වර්ණ – කුලය, පැහැය, අකුර, ආකාරය

18. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යෙදී ඇති වාක්‍ය තෝරන්න.
(1) හිරු උදාවත කුමුදු මල් නොපිපෙයි.
(2) රළ පෙළ වෙරළ කරා හෙමිහිට ඇදෙයි.
(3) විභාගයෙන් ජයග්‍රහණය කළ ශිෂ්‍යයෝ ප්‍රීති ඝෝෂා පවත්වති.
(4) ගුත්තිල මහසිපි සක්දෙව් බසින් සැනසුණේ ය.

19. වැරදි අදහස සහිත වරණය තෝරන්න.
(1) ප්‍රධාන උක්ත පදය පිළිබඳව විස්තර කෙරෙන අනුක්ත පද උක්ත රූපයෙන් ම තැබේ.
(2) කර්තෘ කාරක කෘදන්ත නාමයක් සමග යෙදෙන කර්තෘ වාචක පදය අනුක්ත වේ.
(3) හෝ, හෙවත්, නොහොත්, නිපාත වලින් උක්ත පද කීපයක් එකට බැඳෙන විට එය ද පොදු උක්තයක් සේ සැලකේ.
(4) කිසියම් උක්ත පදයක් පිළිබඳව කියැවෙන වෙනත් පදයක් එම වාක්‍යයේ ම යෙදෙන විට එය ද උක්ත රූපයෙන් ම තැබේ.

20. ඉර, අත, ණය, නල, උල යන වචනවල පළමු අකුරු අයත් අක්ෂර වර්ගය නිවැරදි ව පිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,
(1) ඕෂ්ඨජ, කණ්ඨජ, මූර්ධජ, දන්තජ, තාලුජ
(2) දන්තජ, කණ්ඨජ, තාලුජ, මූර්ධජ, ඕෂ්ඨජ
(3) තාලුජ, කණ්ඨජ, මූර්ධජ, දන්තජ, ඕෂ්ඨජ
(4) තාලුජ, දන්තජ, මූර්ධජ, ඕෂ්ඨජ, කණ්ඨජ

21. සෑම පදයක ම ඌෂ්මාක්ෂරයක් යෙදී ඇති පද පෙළිය තෝරන්න
(1) ප්‍රශ්න, උෂ්ණ, රසය, මල
(2) පාෂාණ, විදර්ශන, වියළි, මිටි
(3) යල, රචන, ලය, වයස
(4) නිදර්ශන, දූෂණ, අහස, කහ

- අංක 22 හා 23 වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.

22. කඳු පර්වත නිසා ගමන් කිරීමට අපහසු ප්‍රදේශ මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා තිබේ.
(1) ජල දුර්ග (2) වන දුර්ග (3) ගිරි දුර්ග (4) දුර්ගස්ථාන

23. අපගේ භූමියට අහිතකර සමහර වල් පැළෑටි සහමුලින් ම උදුරා දැමීම කළ යුතු බව කෘෂිකර්ම උපදේශක මහතා කියා සිටියේ ය.
(1) සමූලඝාතනය (2) සමුලෝත්පාටනය (3) විධ්වංසනය (4) නිරුද්ධ කිරීම

24. දී ඇති සියලු ම පද නිවැරදිව විසන්ධි කර නැති පද පෙළිය තෝරන්න.
(1) රිය + ඇදුරු, සු + උස්මෙන්, මත් + ඇත්, කි + අයුණු
(2) කොස් + අතු, මෙ + අත, සිතු + කම්, සඟ + වැල්ල
(3) වප් + කඩ, ගඟ + රන්, පුන + උත්, රුක් + අත්තන
(4) උක්තා + ඛ්‍යාත, මොළොක් + අකින්, දොඹ + පේ, කොසු + අ

- අංක 25 ,26 යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.

25. හඳටත් බල්ලෝ බුරනවා ලු
(1) නරක පුද්ගලයෝ උතුමන්ටත් ගර්හා කරති
(2) දකින දකින දේට අවමාන කිරීම
(3) සුවිශේෂ ව ආදරය දැක්වීම
(4) ප්‍රයෝජනවත් දෙයක් සිදු කිරීම

26. ඒරියා කඳට නැග්ගහම කරත්ත කාරයාත් සක්විති ලු
(1) සර්ව සම්පූර්ණත්වයට පත් කිසිවෙක් නැත.
(2) අසත්පුරුෂයන් අතර සත්පුරුෂයෝ ද සිටිති.
(3) තමන්ගේ තැනේ දී තමන්ට වඩා කෙනෙක් නැත.
(4) කාගේත් වැරදි එකෙකු පිට එල්ල වීම.

27. මුලින් දී ඇති සමාස වර්ගයට අයත් පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අව්‍යය සමාසය - දුසිරිත්, නොවියත්, සිරිමත්, අභිනන්දන
(2) විශේෂණ සමාසය - දසපණත, සඳවත, ගොවිරාජ, බලුබළල්
(3) අන්‍යාර්ථ සමාසය - නැගෙනහිර, සහසැස්, මලවි, දසබල
(4) විභක්ති සමාසය - ගංදිය, පොළොංවිෂ, රටබඩු, ඉම්හිරි

28. මුලින් දැක්වෙන ක්‍රියා වර්ගයට අයත් පද පමණක් සහිත පද පෙළිය තෝරන්න.
(1) විධික්‍රියා - කියග, දෙන්න, යවු, මිනිසුනි
(2) මිශ්‍රක්‍රියා - නටනවා, කියමින්, දුවද්දී, බලබලා
(3) පූර්ව ක්‍රියා - කියා, බලා, ගොස්, අසවයි
(4) අසම්භාව්‍ය ක්‍රියා - නටත, කියතොත්, එත , බලද්දී



The National e-learning Portal for The General Education

29. 'නටයි' යන පදයේ උත්තම පුරුෂ, කර්ම කාරක, බහු වචන අතීත කාල පදය වන්නේ,

(1) නටමු (2) නටන්නෙමු (3) නැටීමු (4) නැටෙමු

30. පහත (අ), (ආ) කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සැදී ඇති සංඛ්‍යා වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය වන්නේ,

| | | | |
|---|---|---|---|
| A | සංවත්සරය | E | 25 |
| B | රජත ජයන්තිය | F | 75 |
| C | ස්වර්ණ ජයන්තිය | G | 12 |
| D | වජ්‍ර ජයන්තිය | H | 50 |

(1) A සහ F (2) C සහ H (3) B සහ G (4) D සහ E

- අංක 31 ,32 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

31. (1) වන සතුන් කුඹුරට එතියි ගොවියන් සිතති.
(2) වන සත්තු කුඹුරට එතියි ගොවියෝ සිතති.
(3) වන සතුන් කුඹුරට ඒ යැයි ගොවියෝ සිතති.
(4) වන සතුන් කුඹුරට එති'යි ගොවියෝ සිතති.

32. (1) ගුරුවරුන් සිනාසෙන්නේ ඇයි ?
(2) මම පාඩම් කළොත් ගුරුතුමිය සතුටු වෙයි.
(3) විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය ගෙදර ගියෝ ය.
(4) කණ්ඩායම මෙහෙයවන ලද්දේ අපි විසිනි.

33. (1) දරුවෙනි හොඳින් පාඩම් කරන්න. උත්සාහ ගන්න
(2) ඈ ගෙදර යන්නට ම ගියා ය. පැමිණීම පිළිබඳ විශ්වාසයක් නැත.
(3) අද සවස වැසි වැටීමට පුළුවන. ඒ පිළිබඳ කලින් කිව නොහැක.
(4) නගරය අමුතු සිරියාවකින් බබළයි. කුමන පුදුමයක් දැ'යි කේවට්ටයා කීය.

ඉහත වාක්‍ය තනි වාක්‍යයක් වශයෙන් ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වනුයේ,

P නැවත T නමුදු S කොල K තව

(1) K,T,P,S (2) S,K,T,P (3) K,P,T,S (4) K,P,S,T

34. පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ,
අප සෙල්ලම් කළා ම මවුපියෝ අවවාද කළා.
(1) අපි සෙල්ලම් කරද්දී මවුපියන් අවවාද කළේ ය.
(2) අපි සෙල්ලම් කරද්දී මවුපියෝ අවවාද කළහ.
(3) අප සෙල්ලම් කරද්දී මවුපියෝ අවවාද කළෝ ය.
(4) අප සෙල්ලම් කරද්දී මවුපියෝ අවවාද කරයි.

35. යටින් ඉරි ඇඳි පදවල අර්ථ නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
"උදුළ සොමි කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ"

(1) බබළන, චන්ද්‍රයා, ප්‍රෞඪ, රාත්‍රිය නැමැති කාන්තාව
(2) ඉදල්, මුහුද, පුවක්, රාත්‍රිය
(3) බබළන, මුහුද, ප්‍රසිද්ධ, අඹුව
(4) විශේෂ, සයුර නිසා, ප්‍රධාන, කාන්තාව නිසා

36. රූපකයක් සහිත වරණය තෝරන්න.

(1) "මාණික්‍ය සේ පොළෝ ගැබේ නිධාන වී"

(2) "පුල් නිලුපුල් සම්වන් කතක වුවනත"

(3) "මිතුර බලා ලව එන සඳරුස් වතුර"

(4) "මතවරණිඳුට පෙදෙනැන වෙහෙසෙන අයුරු"

37. "තමන් කකුළු කල්හි සර්පයා අතැ මළ බෝධිසත්වයනට දිවි දුන් සනායෙන්"

ඉහත සඳහන් පාඨයේ "සනායෙන්" යනුවෙන් සඳහන් කර ඇත්තේ,

(1) සිහිය යි (2) ආදරය යි (3) සහනය යි (4) වෛරය යි

38. "ඉර පායා ඉර අවරට ගියාදෝ"

"ඔබ එනතුරා නැත මගෙ හිත සැනසෙන්නේ"

"ඉහළ වෙලේ ඉස්මත්තේ - දිය හබරල මල් ගොල්ලේ"

"කුඹුයෝන් සයුරු බොත එහි මිණි සේ අනත"

ඉහත කාව්‍ය ඛණ්ඩ ඇතුළත් කෘති වන්නේ,

(1) ධීවරි ගීතය, දුකට කියන කවි සීපද, බසින් රස මවන සාහිත්‍යය, මිණි ගණ සඳෙස් වැණුම.

(2) දුකට කියන කවි සීපද, ධීවරි ගීතය, මිණි ගණ සඳෙස් වැණුම, බසින් රස මවන සාහිත්‍යය.

(3) මිණි ගණ සඳෙස් වැණුම, දුකට කියන කවි සීපද, ධීවරි ගීතය, බසින් රස මවන සාහිත්‍යය.

(4) දුකට කියන කවි සීපද, ධීවරි ගීතය, බසින් රස මවන සාහිත්‍යය, මිණි ගණ සඳෙස් වැණුම.

39. සත්කෝරළේ උප භාෂාවේ "කුඩහලුවා" යනුවෙන් හඳුන්වන්නේ

(1) අලියා (2) පිරිමි ළමයා (3) හමුවීම (4) උදැසන

40. දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

හුස්ම ඉහළට ගැනීම සහ පිට කිරීමේ ක්‍රියාවලිය නිශ්චිත රටාවකට අනුව නිවැරදිව සිදුකිරීම, ශරීරය සැහැල්ලු වීම කෙරෙහි මෙන් ම චිත්ත ඒකාග්‍රතාවය ඇති කරගැනීම කෙරෙහි ද බලපායි. ශරීරයේ සැහැල්ලු බව රංගන කාර්යයේ දී එක් එක් චරිතයට උචිත අයුරින් සිරුර හැසිරවීමට නළු නිළියන්ට අත්‍යවශ්‍ය සාධකයකි.

(1) ආශ්වාස ක්‍රියාවලිය, සිතේ ඒකාග්‍රතාවට බලපාන අතර සැහැල්ලු වීම ද ඉන් සිදුවේ. රංගන කාර්යයේ දී නළු නිළියන්ට මෙය ඉතා අවශ්‍ය වේ.

(2) හුස්ම ගැනීම පිට කිරීම රිද්මයකට අනුව සිදු කිරීමෙන් සැහැල්ලු වීමට ද සිතේ නොසන්සුන් බවට ද මෙන් ම රංගනයට ද මහඟු අත්වැලක් සැපයෙනු ඇත.

(3) ආශ්වාස ප්‍රශ්වාසය රටාවකට අනුව නිවැරදි ව කිරීමෙන් ශරීර සැහැල්ලුව, චිත්ත ඒකාග්‍රතාව කෙරෙහි බලපාන අතර රංගනයේදී එය අත්‍යවශ්‍ය සාධකයකි.

(4) රංග කාර්යයේ දී සිතේ ඒකාග්‍රතාව අත්‍යවශ්‍ය ම සාධකයකි. ශරීරයේ සැහැල්ලු බවට එය අත්‍යවශ්‍ය බව නො කිව මනා ය.

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper II | පැය / மணித்தியாலம் / Hours 02 |

සැලකිය යුතුයි :-
ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) සිංහල අක්ෂර මාලාවේ ඬ, ඟ අක්ෂර අයත් වන්නේ අර්ධ අනුනාසික්‍ය අක්ෂර ගණයට නම් ඤ, ඦ අක්ෂර අයත් වන්නේ කුමන ගණයට ද ?

(ආ) "හඬ නගා ක්‍රියවීමේ දී මහාප්‍රාණ හා සඤ්ඤක අක්ෂර මනාව උච්ඡාරණය කළ යුතුවේ". උක්ත වැකියේ අක්ෂර වින්‍යාසය වැරදි පදය නිවැරදි කර ලියන්න.

(ii) පාරින්දි, ඉමර්ෂා, පූර්ණි, තරුෂිකා , පවිත්‍රා යන නම් අකාරාදි පිළිවෙළට පෙළගැස් වූ කල
(අ) මැදට යෙදෙන නම කුමක් ද ?

(ආ) දෙවනුව යෙදෙන නමේ දෙවන අකුරට යෙදී ඇති පිල්ලම නම් කරන්න.

(iii) (අ) පැල වෙත යන ගෙවිලිය ගොයම් පැළ දෙස ආශාවෙන් බැලුවා ය.
උක්ත වගන්තියේ පැල, පැළ යන පද යෙදී ඇති ආකාරය බලා කල, කළ යන පදවල අර්ථ පැහැදිලි වන සේ එක් වාක්‍යයක් ලියා දක්වන්න.

(ආ) "වත" යන්නට වස්ත්‍රය, ව්‍රතය, මුහුණ, වස්තුව යන විවිධාර්ථ පද යෙදේ. "සත" යන්නට දියහැකි විවිධාර්ථ පද දෙකක් ලියන්න.

(iv) (අ) "ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්, කෞතුකාගාරයේ තැබීම සඳහා සුප්‍රකට චිත්‍ර ශිල්පී ජෝර්ජ් කීට්ගේ "පූජාව" නම් චිත්‍රය මිල දී ගත්තේ ය." මෙම වැකියේ සඳහන් නිපාතයක් සහ උපසර්ගයක් ලියන්න.

නිපාත ....................................
උපසර්ග ....................................

(ආ) " නු" ප්‍රත්‍යයෙන් අවසන් වන තද්ධිත පදයක් සහ "ඉලි" ප්‍රත්‍යයෙන් අවසන් වන කෘදන්ත පදයක් ලියන්න.

(v) (අ) "සියයක් පත්‍ර ඇත්තේ" යන්නට තනි පදය වන්නේ ............................................ යි.
(ආ) " සරු සාර" යනු යුගල පදයකි. මෙම වර්ගයට අයත් යුගල පදයක් ලියා දක්වන්න.

(vi) (අ) ආඥා චක්‍රය - අණ සක වන අයුරින් "චක්‍රාවාටය" යන පදය සැකසෙන ආකාරය ලියන්න.

(ආ) "කුමරතුඟුවන්ගෙ "හාවාගේ වග" පද්‍ය පංතිය ජංගමශීලි චිත්තරූප දනවන්නකි." උක්ත වැකියේ යටින් ඉරි ඇඳි පදය කුමන විභක්ති අර්ථ දක්වයි ද ?

(vii) (අ) පහත සඳහන් වැකියේ උක්ත ආඛ්‍යාත නිවැරදිව සකසන්න.
"සියලු ලෝ වැස්සෝ නීරෝගී වීම මැනවි"

(ආ) පහත දැක්වෙන වැකිය කර්තෘ කාරකයට හරවන්න.
"ශිෂ්‍ය සංවිධානයෙ සාමාජිකයන් විසින් ශිෂ්‍ය නායකයෝ ඇගයෙති."

(viii) පහත දක්වා ඇති පද විසන්ධි කොට සන්ධි වර්ගය දක්වන්න.

(අ) මංමුළා ..........................+ ...................... .........................

(ආ) සුවාසු ..........................+ ...................... .........................

(ix) (අ) විස්මයාවහ/ කදෝපැණියන් යන්නෙහි අර්ථ ලියා දක්වන්න.

(ආ) පරිමිත භාෂා ව්‍යවහාරයට අයත් ධීවර භාෂාවේ දී "මරක්කලාහෙ" යනුවෙන් හැඳින්වෙන්නේ කවරුන්ද ?

(x) (අ) කුරුල්ලෝ යන නාම පදයෙහි ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(ආ) "ලිය" යන ධාතු ප්‍රකෘතිය ඇසුරෙන් කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාපදය සාදා ලියන්න.

(ල. 02 x 10 = 20)

The National e-learning Portal for The General Education

02. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ.
- යොදන මාතෘකාව; ආදිය පිළිබඳව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

අ) භාෂාවක සජීවී බව ඕජෝ ගුණය පළ කෙරෙන සාම්ප්‍රදායික යෙදුම්වලින් හෙළ බස පොහොසත් ය. එහි අංග වන ප්‍රස්තාව පරුළු, ඉඟි වැකි හා ආප්තෝපදේශවලින් භාෂාවට සිදුවන මෙහෙය අනල්ප වේ. මිනිස් හා සත්ත්ව චර්යා පිළිබඳ ව දැනුවත් වීමටත් භාෂාවේ ව්‍යංග්‍යාර්ථවත් හා භාවපූර්ණ බව ඇති කිරීමටත් ජීවිතය සාර්ථක කර ගැනීමටත් සාම්ප්‍රදායික යෙදුම් භාවිත කළ හැකි ය. එවැනි හර බර රස පිරි භාෂා උපාංග වියැකෙමින් රසයත් හරයත් අනන්‍යතාවත් සුන් වූ සංකර බසක් එළි දකිමින් පවතී. දේශීය උරුවෙන් ද ඕජෝ ගුණයෙන් ද පිරි බසක් ගොඩ නැගීමට අත්වැල දිගු කරමු.

ආ) අතීතයේ විසූ මිනිස්සු ස්වාභාවික විපත්වලින් ආරක්ෂා වීමට පුද පූජා පැවැත්වීම් , භාර හාර වීම් ආදියේ යෙදුණාහ. මෑත අතීතයේ නියං, ගං වතුර, සුනාමි අවි ගබඩා ගිනි ගැනීම වැනි භයානක අනතුරු වාර්තා වුව ද එවන් අභිචාර විධි මගින් පිහිට පැතූ බවට සාක්ෂ්‍ය නැත. එවැනි අවස්ථාවකට අප මුහුණ දිය යුතු අයුරු හා ආරක්ෂා වීමේ ක්‍රියා පිළිවෙළ දැනුවත් වීම තුළින් ආපදා අවස්ථා මැනැවින් කළමනාකරණය කර ගත හැකි වේ. එබැවින් ආපදා කළමනාකරණය යන විෂය සුළුවෙන් තැකීම නුසුදුසු ය.

ඉ) "ඔබ යොදවන මුදල මෙන් දෙගුණයක් පොලිය සේ වර්ෂයක් තුළ උපයන්න." පෞද්ගලික කුඩා මූල්‍ය ආයතන මගින් පළ කරන මෙවැනි යෝජනා සහිත අත්පත්‍රිකා පුවත්පත් හා රූපවාහිනී දැන්වීම් වර්තමානයේ සුලබව දැකිය හැකි වේ. අදූරදර්ශීව මෙවැනි පෞද්ගලික කුඩා මූල්‍ය ආයතනවල තමා සතු ධනය තැන්පත් කරන්නෝ බොහෝ වෙති. එසේ ම එම නීත්‍යානුකූල නොවූ අසංවිධිත ආයතන මගින් සිදුවූ අක්‍රමිකතා නිසා අසරණ වූ පුද්ගල කණ්ඩායම් පිළිබඳ තොරතුරු ද නිරතුරුව වාර්තා වේ. වංචාව දූෂණය අපරාධ පිටු දැකීම සඳහා බැඳුණු ආයතන මගින් පෞද්ගලික ධනයේ සුරක්ෂිතතාව ලබා දිය යුතු වන්නේ ය.

ඊ) සෙල්ලම් ගෙය සාදා නිම කළ මල්ලීගේත් නංගීගේත් මුහුණුවල දක්නට ලැබුණේ ජයග්‍රාහී සිනාවකි. ඔවුන් ගේ පුරාන් වත්ත පුරාත් සෙල්ලම් ගෙදරට අවශ්‍ය බඩු සොයන්නේ මා තඹයකට මායිම් නොකරමිනි. විභාගයට මුහුණ දීමට සූදානම් වන මට ඔවුන් හා සෙල්ලම් කිරීමට කාලය විසින් වාරණ පනවා ඇතැයි ළතැවෙමින් සිටින මසිතට විවිධාකාර සිතුවිලි ගලා එන්නේ නිරායාසයෙනි. ..............................

ඉහත විස්තරය ඉදිරියට ගෙන යමින් නිර්මාණාත්මක රචනාවක් ලියන්න.

(ලකුණු 25)

03. පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ශ්‍රී ලංකාවේ අත්කම් ජන කලාව කුමන යුගයක දී ආරම්භ වී ද යන්න නිසැකයෙන් ම කිව නොහැකි ය. ක්‍රිස්තු පූර්ව යුගයේ භාරතයේ සිට මෙහි පැමිණි ආර්ය සංක්‍රමණවල ප්‍රතිඵලයක් ලෙස ස්ථාපිත වූ කෘෂිකාර්මික ජීවනෝපාය සඳහා අවශ්‍ය මෙවලම් ශිල්පීය ක්‍රමවේද ආර්යයන් විසින් රැගෙන එන්නට ඇතැයි සිතිය හැකි ය. එකල ලක්දිව ජීවත් වූ ගෝත්‍රික ජනයා විසින් ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා නිර්මාණය කළ මෙවලම් හා භාණ්ඩ ද ඒවා සාදන ලද ක්‍රමවේදයන් ද සමග සංකලනය වීමෙන් නිපැයුණු අත්කම් භාණ්ඩ වලින් ශ්‍රී ලංකාවේ අත්කම් ජන කලාව ආරම්භ විණැ'යි කිව හැකි ය. ඒ අනුව මහා වංශයේ සඳහන් වන ආකාරයට විජය කුමරු හා කුවේණි හමුවීමේ දී කුවේණිය නූල් කටිමින් සිටි සිද්ධියත් පණ්ඩුකාභය කුමරු උපන් අවස්ථාවේ දී මාමාවරුනට නොදැනෙන්නට රහසිගත ව දාසියක විසින් කුමරාව වේවැල් කූඩයක බහා දොරමඬලාවට සඟවා ගෙන ගිය සිද්ධියත් ආශ්‍රයෙන් පැහැදිලි වන්නේ පේෂ කර්මාන්තයත් වේවැල්වලින් කූඩා තැනීමේ කර්මාන්තයත් හස්ත කර්මාන්තය ලෙස පැවති බවයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ක්‍රි.පූ. යුගයේ සිට ම පැවති බව මහාවංශයේ සඳහන් සටහන්වලින් සනාථ වේ. මේ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයෙහි ද ශ්‍රී ලංකාවේ කාන්තාවන් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා දායකත්වය ලබා දෙන්නට ඇතැ යි සාධක සහිත ව ඔප්පු කිරීමට කදිම උදාහරණයකි, විජය කුවේණි හමුවේ දී කුවේණිය කපු කටිමින් සිටීම.

(ලකුණු 10)

04. පහත සඳහන් පද්‍ය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සුනිල් ගනපතින්
සැදි පැළ කොහොඹ ගසකින්
ලද සිහිලත් අඳුරත්
සොඳුරු වූ පඳුරු ගැව්ල්ලෙකි.

වැට මුල්ලෙක වූ
ඒ අඳුරු පඳුරු වදුලේ
පේර ගොමු අතරේ වේ
පින්න වල්ලා කසට ඈ පැළ

පොතු ගැලවුණු ලුණු
වරණ ගස වැට මුල්ලේ
ඔසුවට ඇඟ මස් දත් දුන්
බවක් කියා පෑ සඳ දූ නොතකා

ඒ මැද පොල් ගසේ
බෙණයක් නිවෙස කොට ගත්
මී මැස්සෝ ලිය ගෙය
ගුමු නදින් පුරවාලති

(i) කවියට අනුව මෙම ස්ථානයට සිසිලසත් අඳුරත් ලැබුණේ කුමක් ආශ්‍රයෙන් ද ?
(ii) මී මැස්සන් තම ගුමු නදින් කරන ලද්දේ කුමක් ද ?
(iii) මී මැසි ගෘහය ලෙස භාවිත වන්නේ කුමක් දැ'යි දක්වන්න.
(iv) ලුණුවරණ ගස ශරීර මාංශ දත් දුන් බවක් පෙනෙන්නේ කුමක් නිසා ද ?
(v) සුනිල්, ගනපත්, ඔසුවට යන පදවල අර්ථ දක්වන්න.

(ලකුණු 2x5 = 10)

05. උඩගෙවත්ත ජයමුතුගම පිහිටි "නිමිනාදි" ප්‍රකාශන ආයතනයෙන් අ.පො.ස සා.පෙළ විභාගයට අදාළ ව හර විෂයයන් සඳහා විෂය විශේෂඥයින් ලියූ ඉලක්ක ප්‍රශ්නෝත්තර පොත් හයක් ප්‍රකාශයට පත් කර ඇත. එම පොත් හඳුන්වා දීම සඳහා 40% ක වට්ටමක් සහිතව 2016 නොවැම්බර් 30 දක්වා ආයතන පරිශ්‍රයේ දී අලෙවි කෙරේ. මේ බව පාරිභෝගික ජනතාව වෙත දැනුවත් කිරීම සඳහා වෙළෙඳ දැන්වීමක් නිර්මාණය කර ගැනීමට ආයතනයේ ප්‍රචාරක කළමනාකාර තරින්ද ජයසිංහට අවශ්‍ය වී ඇත. මෙම වෙළෙඳ දැන්වීම ආකර්ෂණීය ලෙස නිර්මාණය කරන්න. (වචන 100 ක් පමණ සෑහේ)

නැතහොත්,

ස්වයංරැකියා ලෙස කුඩා පරිමාණයේ සුළු භෝග වගා කරන්නන් වෙත ආධාර සපයා දී දිරිමත් කිරීමේ අරමුණින් සුළු භෝග වගාකරුවන්ගේ සංගමය නව සාමාජිකත්ව දහසක් බස්නාහිර පළාත සඳහා පිරිනැමීමට තීරණය කර ඊට සුදුසු අයගෙන් අයදුම්පත් කැඳවා ඇත. ඔබගේ සියලු පෞද්ගලික තොරතුරු සමගින් ඔබ කරන වගාවේ ස්වභාවය, ඔබට හිමි භූමි ප්‍රමාණය, වගාව අරඹා ගතවූ කාලය, මසකට උපයන ආදායම (දළ වශයෙන්) ඔවුහු අපේක්ෂා කරති. එස්. ගයනි වර්ණකුල වන ඔබ ඇන්තූරියම් හා ඕකිඩ් වැනි විසිතුරු මල් වර්ග වවා පිටරට යවන ආනන්ද මාවත, අස්ගිරිය පිහිටි 'සෞම්‍යා මල්මී' ආයතනයේ හිමිකරු යැය සිතා සංගමයට ඉදිරිපත් කිරීම සඳහා සුදුසු අයදුම්පතක් සකසා සම්පූර්ණ කරන්න.
(වචන 100ක් පමණ ප්‍රමාණවත් වේ)

18801

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# மேல் மாகாணக் கல்வித் திணைக்களம்
# Department of Education - Western Province

## වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2016
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 11 | විෂයය / பாடம் / Subject } සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper } III | පැය / மணித்தியாலம் / Hours } 02 |

සැලකිය යුතුයි :-

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6,7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

01. (i) සිට (X) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය යොදා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) උන්වහන්සේ විසින් "රජ්ජුරුවෝ ගිවිස්සෝ ද යි" විචාළ කල්හි
(අ) මෙහි සඳහන් වන රජුගේ නම ලියන්න.
(ආ) මෙහි සඳහන් පරිදි ගිවිසි කාරණය කුමක් ද ?

(ii) "අවුරුද්ද පහු වෙලත් දැන් මාස හයක් වෙනවා"
(අ) මෙම පාඨය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද ?
(ආ) මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද ?

(iii) "රන් තරු පිරිවරා ගත් සඳ මඬල යට"
(අ) මෙම කවි පාදය සඳහන් වන පද්‍ය පන්තිය රචනා කළ කතුවරයා හැඳින් වූ අන්වර්ථ නාමය කුමක් ද ?
(ආ) ඔහු විසින් ලියන ලද වෙනත් කෘතියක් නම් කරන්න.

(iv) (අ) කුස ජාතකය ඇසුරු කර ගෙන මහාචාර්ය සරච්චන්ද්‍රයන් විසින් නිර්මාණය කරන ලද නාට්‍යයේ නම ලියන්න
(ආ) එතුමා "ස්වර්ණ රජත" සම්මානයෙන් පුදනු ලැබුවේ කිනම් රටකින් ද ?

(v) "මහණෙනි ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද"
(අ) මෙම ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද ?
(ආ) මෙම පාඨය සඳහන් කෘතිය රචනා කළ කතුවරයාගේ නම ලියන්න.

(vi) "අග පිපි මල් මලිගිය ලිය කැලේයා"
(අ) මෙම පද්‍ය පාදය ඇතුළත් කෘතිය රචනා කළ කතුවරයාගේ නම ලියන්න
(ආ) එතුමා විසින් රචනා කෙරුණු වෙනත් කෘතියක් නම් කරන්න

(vii) "නෑ ආයිබොවන්, මේ දවස් ටිකේ එක දිගට කුඹුරු වැඩ තිබුණා"
(අ) "ආයිබොවන්" යනුවෙන් අදහස් කළ පුද්ගලයා කවුරු ද ?
(ආ) මෙම ප්‍රකාශය උපුටාගත් කෘතියෙහි කතුවරයාගේ නම ලියන්න.

(viii) (අ) මහගම සේකරයන් විසින් චිත්‍රපටයට නැගුණු ඔහුගේ ම නවකතාවේ නම ලියන්න.

(ආ) "තරු ලකුණ"කාව්‍ය ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.

(ix) "මොකද ? මේ ඔයාට වෙලා තියෙන්නේ?"

(අ) මෙය කවුරුන් විසින් කරනු ලැබූ ප්‍රකාශයක් ද ?

(ආ) මෙම පාඨය ඇතුළත් මුල් ග්‍රන්ථය ලියූ කතුවරයාගේ නම ලියන්න.

(x) "මෙ වෙනි සිංහනාදයෙක් අනෙකක් හට වන්නෙ නො වෙයි"

(අ) මෙසේ සිතූ අයගේ නම ලියන්න .

(ආ) මෙම පාඨය ඇතුළත් කෘතිය රචනා වූ යුගය සඳහන් කරන්න.

(ලකුණු 2x10=20 යි)

02. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) දිමුත් වෙහෙර වට විසිතුරු මල් වතුය
එහිත් සුවඳ මල් නිති වෙයි **මිණි** මුතුය
**මහත් තුරු** මියුරු පල ගෙන නැමි අතුය
රැගත් සෙවණ නොහැර ම සිටි පොල් වතුය

(අ) අංකිත පදවලට අර්ථ සපයන්න.

(ආ) මෙම පද්‍යයෙන් කැරගල ගම පිළිබඳ ව කියවෙන ප්‍රධාන කරුණු දෙක කුමක් ද ?

(ii) "වහන්සෙ, සැවැත් නුවර කෙණෙසි අහර සිඟනුයෙම් **මුළුගර්භ මාගමක දිටිමි**. ඇය විඳුනා දුක් මට නුරුස්සී" කීහ.

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) මෙම ප්‍රකාශයට අනුව ප්‍රකාශය කළ තැනැත්තා තුළ පවතින උතුම් ගුණය කුමක් ද ?

(iii) එන්නේ කොහි සිට ද කොතැනකට ද යන්නේ
ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ
මිනිසුන් ගිහින් නිතර ම ආපසු එන්නේ
කිමදැයි කියා කිසිවකු ඇයි නොසොයන්නේ

(අ) මෙහිදී "මා" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද ?

(ආ) මෙම පද්‍ය[illegible] ගැබ් වන දාර්ශනික අදහස කුමක් ද ?

(iv) රුක වනපෙතිනැවිදින් සුමුවෝයා
නිති මියුරැති වෙණ නදළමුවෝයා
සිතිවිලි නැති රූ විලස මුවෝයා
තැති නොගතිති මිනිසුන් සමුවෝයා

(අ) 'සුමුවෝයා' සහ 'සමුවෝයා' යන පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.

(ආ) මෙහි දැක්වෙන උපමාව ඔබේ වචනයෙන් ලියන්න.

(v) ඉතා ම බඩ සා සැටි ය. කැමැත්තෙහි වී නම් <u>තිලින් පොදියක්</u> කොට බැඳ ගෙන ගොස් <u>පැහැර පියා</u> පිසගෙන බඩ පුරා කා නොමිය" යි කීහ.

(අ) අංකිත පදවලට අර්ථ සපයන්න.
(ආ) මෙම ඡේදයෙන් ගම්‍ය වන නව රස ගුණය කුමක් ද ?

(ලකුණු 4x5=20යි)

- 3, 4 යන ප්‍රශ්නවලට වචන 150-200 අතර විය යුතු ය.

03. සාර්ථක විවාහ ජීවිතයකට ,

(i) සුදුසු ජීවනෝපායක් සරිකොට ගැනීමත්,
(ii) එකිනෙකාට ගෞරවයෙන් යුතු ව සැලකීමත්,

අතිශය වැදගත් වන් බව "උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව" පාඩමෙන් අපට පසක් කරයි. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් ගෙන මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 15යි)

**නැතහොත්,**

සැළලිහිණි සංදේශය සාර්ථක නිර්මාණයක් වීමට,

(i) අපූරු කාව්‍යාලංකාර යොදා ගැනීමටත්,
(ii) ධ්වනි පූර්ණ භාෂාවක් යොදා ගැනීමටත්,

**කතුහිමියන්ට තිබූ** කුසලතාව හේතු වූ ආකාරය **'මග විසිතුරු'** පාඩම ආශ්‍රයෙන් එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

04. සිංහබාහු නාට්‍යයෙහි එන "සුපපා දේවිය"

(i) විටෙක දරු සෙනෙහසත්,
(ii) තවත් විටෙක දැඩි ස්වාමි භක්තියත්,

අතර දෝලනය වෙමින් පාඨක අනුකම්පාවට ලක්වූ චරිතයකි. එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** ගෙනඒ බව සනාථ කරන්න.

(ලකුණු 15 යි)

**නැතහොත්,**

"දෑතේ කර ගැට සිඹ සනසන්නට ..........." ගීතයෙන් ශ්‍රාවකයා තුළ

(i) ජාතිකාභිමානයත්,
(ii) ශ්‍රමාභිමානයත්,

ජනිත කරවීමට මහගම සේකරයන් විසින් ගනු ලැබූ උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත් ද "යි එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

• 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** උත්තර සපයන්න. වචන 125-150ක් අතර විය යුතු ය.

05. 'උම්මග්ග ජාතකයෙහි එන "මහෞෂධ" චරිතය උදාර නායකයකුගේ ගති ලක්ෂණ ප්‍රකට කරය' උදාහරණ **තුනක්** සහිත ව මේ පිළිබඳ විමසීමක් කරන්න.

06. වැසිකිළි භාවිතය පිළිබඳ ගම්මුන් තුළ තිබූ ආකල්ප තාත්වික ව ඉදිරිපත් කිරීමට කතුවරයා දැක්වූ කුසලතාව "අපට වැසිකිළියක්" පාඩමෙන් උදාහරණ **තුනක්** ගෙන පැහැදිලි කරන්න.

07. ගුත්තිල කතුවරයා අවස්ථා නිරූපණයේ දී දැක්වූ විශිෂ්ට කුසලතාව උදාහරණ **තුනක්** මගින් විමසන්න.

(ලකුණු 10යි)

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | I, II, III | පැය / மணித்தியாலம் / Hours 03 |

සැලකිය යුතුයි:
I කොටසෙහි 1,2 ප්‍රශ්නවලටත් , I I කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත් , I I I කොටසෙහි 4,5,6,7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් උත්තර සපයන්න

## I කොටස

1 (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ) (ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) " ඉදින් මම තදකොට කීම් නම් මොහුගේ ළය පැළී - යන්නේය.එහෙයින් අස්වසා කියමි."
(අ) මෙය කුමන දෙයක් සම්බන්ධ ව කළ ප්‍රකාශයක් ද?
(ආ) මේ පාඨය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

(ii) කොතෙක් ගුණ කළත් දුදනන් හට අසුබ
අකක් පමණවත් නොම කෙරෙති පිළිලබ
එළක් රසෙහි සැදුවත් නිඹ බිජු කිරඹ
උදක් තිත්තමය පසහම තුරෙහි නිඹ
(අ) මෙහි අවසන් පද දෙකෙහි අදහස ලියන්න.
(ආ) මේ කවිය අයත් ග්‍රන්ථය ලියූ යුගය කුමක් ද?

(iii) " කටේ හැටි, කිරි අප්පුගෙ හොඹු කට වගෙයි."
(අ) මේ ප්‍රකාශය කළේ කවුරුන් ගැන ද?
(ආ) මේ කොටස අයත් කතාව ලියූ රචකයා නම් කරන්න.

(iv) චිචිරි චිරි චිචිරි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නොකැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොලන
(අ) මෙහි චිචිරි චිරි චිචිරි චිරි යනුවෙන් ඇති පදවලින් කියවෙන කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මේ කවි පදය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද?

(v) " හෙම්බා පුත, තුලුන් දුටුද තුලුන් සිහා
ඇවිදිනා පමණක් මුත් ගවු දෙගවු සතරගවු ......... "
(අ) මේ ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මේ කොටස ඇතුළත් කතාව උපුටාගත් ග්‍රන්ථය කුමක් ද?

( ලකුණු 4 × 5 = 20 යි )

2. පහත දී ඇති පැදිපෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්දෙ මූකලාන කම්පා කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද වැටුණේ
අඩ නින්දෙ ම පන් පැදුරට උණු කඳුලක් හැලුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් කැපුවත් නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන හිනැහෙන්නේ
සියතින් මර විපත කටින මිනිසුන් දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී ඉන්නේ

පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහේ නිදියනවා
පැල්ලේ වහල ඇද හැළිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

පොරව කියත කලුවරේ ම පණ ආවා ලෙසිනේ
මගේ ඇඟ උඩ පට්ටල් බැඳ කපනු ඉරනු වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියො ම රුවටෙන්නේ
කාන්තාර ගම මායිම් තවත් පුළුල් වෙන්නේ

(i) කවි පන්තියෙන් කවියා ඉදිරිපත් කරන අනුභූතිය ( අත්දැකීම ) කුමක් ද?

(ii) එම අත්දැකීම ඉදිරිපත් කිරීමට උපයෝගී කරගත් උත්ප්‍රාසාත්මක බව කෙතරම් උචිත ද?

(iii) කවි පෙළ තුළින් සොබාදහමේ යථාර්ථ ස්වභාවය නිරූපණය කර ඇති ආකාරය කෙසේ ද?

(iv) ඒ සඳහා භාෂාව කෙතරම් දුරට ගැළපේ දැ යි පැහැදිලි කරන්න.

(v) කවියා කාව්‍ය සඳහා පාදක කරගෙන ඇති දෘෂ්ටිකෝණය රසවත් බව ඇති කිරීමට උචිත වූවක් දැයි කෙටියෙන් විස්තර කරන්න

( ලකුණු 25 යි )

## II කොටස

3. පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් <u>එක කොටසකට පමණක්</u> උත්තර සපයන්න.

පෙරහැර හිතුවාට වඩා අලංකාර විය.අලි ඇතුන් සහිත කීවාට මොකද ඇත්තෙන් ම හිටියේ මංඩාවල රාළහාමිගේ අලියා පමණකි.ඒ උනත් වෙනත් නැටුම් රාශියක් තිබුණි.මුලින් ම අයිසෙ නැව පැදගෙන එයි.ඒ දුටු මට සුබාසිතෙන් කට පාඩම් කරපු කවියක් මතක් විය.ගොඩින් නැව දියෙන් රථය ද නොයනු ඇත.ඊ ළඟට අලියාට පසුපසින් කොඩි රැගත් ළමයි දෙපලක් යති.මේ ළමයි රදාවානේ ශ්‍රී සුගතේන්ද්‍රාරාම ඉරුදින දහම් පාසලේ මාත් එක්ක ඉගෙන ගන්නා අයයි.ඒ එක්කම ඇංටිං ගිනිබෝල කරකවමින් යයි.ඊ ළඟට ජම්බෝල මල්ගස් රැගෙන එන ළමයි දෙපළ ය.උක්කුනුත් ඇල්බටුත් කොළපත් වෙස් මූණු බැඳගෙන කොළ අතු ඇඳගෙන ඇඟපතේ දැලි තවරාගෙන වැද්දන් මෙන් නට නටා යති.වර්ලියානුත් පුංචප්පුත් පැට්‍රෝමැක්ස් ලාම්පු උස්සා පෙරහැරට එළිය සපයති.වර්ලියානුට ඉදිරියෙන් පන්තේරු නැටුම් ය.කිඳුරාත් කිඳුරියත් දෙපසින් හා පිටුපසින් ලී අත් හැඩි බැඳගෙන කම්මුල්වල රෝසපාට ඩයි ගාගෙන ලේන්සු පොඩි කරකවමින් නටති.

(i) මෙම උධෘතයෙන් පෙන්වා දෙන පෙරහැරක අංග මොනවාද? ( ලකුණු 05 යි)

(ii) එහි ඇති අපූර්වත්වය චිත්තරූප මවමින් ඉදිරිපත්කර ඇති ආකාරය කෙසේ ද? ( ලකුණු 05 යි)

(iii) මෙම කොටසින් ඉස්මතු කෙරෙන සජීවී නිරූපණයට නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. ( ලකුණු 05 යි)

(iv) ගැමි පරිසරයක පෙරහැරක ස්වභාවය, ව්‍යවහාරය මුසු භාෂාව භාවිත කරමින් ඉදිරිපත් කර ඇති ආකාරය උධෘත ඇසුරින් විමසන්න. ( ලකුණු 10 යි)

<u>නැතහොත්</u>

ගෙන එයි මිහිරි ගී මදනල හමන          විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු          මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළව          පිට
උදයට පෙනේ බොල්පිනි බිඳු පබලු          ඇට

තනිබව දැනේ එහි කවුතුක රසය          ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු          නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය          මත
උගතිම් කිමද මිනිසා සතු දෙනෙත          තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර          වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැමතැනම          සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි          හැටී
කළුගල් යකඩ නොව උණු වී හැලෙන          ඉටී

බැඳ ඇති විලංගුව පාමිණි සලඹ          කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි          පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන          විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස          මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන          රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි කෙනෙකු          විසින්
ඒවා කඩා බිඳගෙන එහි පිරුණු          පසින්
පාලම බැදෙනු ඇත දවසක උතුරු          දෙසින්

පැයකදි එකට හමුවන දුර ඇත          දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙද          කොතන
සුරුට්ටුවට එක් වී උතුරේ          ඔතන
බේදය පිළිස්සී හමුවේවා          දකුණ

The National e-learning Portal for The General Education

(i) මෙහි කියවෙන පරිදි මේ ජාතීන් අතර ප්‍රබල වෙනසක් නැති බවට එක් නිදසුනක් දක්වන්න.
( ලකුණු 5 යි)

(ii) මිනිස් ජීවිතය තුළ ඇති සංවේදී බව කවියා තම අත්දැකීම තුළින් පෙන්වා දී ඇති අයුරු පැහැදිලි කරන්න.
( ලකුණු 5 යි)

(iii) කාලීන වටිනාකමක් කවියක් ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳ ව ඇති උචිත බව විස්තර කරන්න.
( ලකුණු 5 යි)

(iv) කවියා සිය අත්දැකීම් රසවත් ව ඉදිරිපත් කිරීමට කාව්‍යෝක්ති උපයෝගී කරගැනීම පිළිබඳව ඇති කුසලතාව විමසීමට ලක්කරන්න.
( ලකුණු 10 යි)

## III කොටස

මෙම කොටසේ <u>ප්‍රශ්න දෙකකට පමණක්</u> උත්තර සපයන්න.
( එක් උත්තරයක වචන 150ක්වත් තිබිය යුතු ය )

4. සොබාදහමේ අපූරු අත්දැකීමක් " වැස්ස " පද්‍ය මගින් ඉදිරිපත් කර ඇත්තේ, සජීවී නිරූපණයක් ලෙසය. නිදසුන් තුනක්වත් දක්වමින් විමසන්න. ( ලකුණු 15 යි)

5. ' කුස ජාතකය ' කියවන අසන විටදී අපූරු වාග් චිත්‍ර මැවෙන්නේ ජාතක කතාකරු සතු භාෂා භාවිතයේ විශේෂත්වය නිසාය.කුස ජාතකයෙන් නිදසුන් තුනක්වත් දක්වමින් විස්තර කරන්න. ( ලකුණු 15 යි)

6. ' සුභාෂිතය ' කවියා මිනිස් ජීවිතවලට උපදෙස් ලබාදීමට ජීව අජීව වස්තූන් කදිමට උපයෝගී කර ගැනීම සාර්ථකය. නිදසුන් තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. ( ලකුණු 15 යි)

7. ' වෙසක් පහන ' කෙටිකතාවේ දෘෂ්ටිකෝණය තුළින් ළමා ලොවේ අපූරුබව, හැඟීම් සිතුවිලි කදිමට ඉදිරිපත් වන අයුරු නිදසුන් තුනක්වත් දක්වමින් සාකච්ඡා කරන්න. ( ලකුණු 15 යි)

***